# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
## මධ්‍ය වාර පරීක්ෂණය - 2014
## බුද්ධ ධර්මය – I පත්‍රය
## 6 ශ්‍රේණිය

කාලය මිනිත්තු 30 යි.

නම / විභාග අංකය :- ..........................................................................................

---

අංක 1 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න

01. සිදුහත් බෝසතාණන් වහන්සේගේ උපත සිදුවූයේ
    (i) පොසොන් පොහොය දිනදී ය    (ii) ඇසළ පොහොය දිනදී ය
    (iii) වෙසක් පොහොය දිනදී ය    (iv) උඳුවප් පොහොය දිනදී ය

02. බෞද්ධයාගේ අත්පොත ලෙස සැළකෙන්නේ
    (i) පිරිත් පොතයි    (ii) ජාතක පොතයි    (iii) ධම්ම පදයයි    (iv) ත්‍රිපිටකයයි

03. ත්‍රිවිධ චෛත්‍ය අතරින් මුලින්ම වන්දනා කරනුයේ
    (i) ශාරීරික චෛත්‍යයි    (ii) උද්දේසික චෛත්‍යයයි
    (iii) පාරිභෝගික චෛත්‍යයයි    (iv) බෝධීන් වහන්සේයි

04. තුන් ආකාරයකින්ම පිරිසිදු සීලය හඳුන්වන්නේ
    (i) චාරිත්‍ර සීලය නමිනි    (ii) වාරිත්‍ර සීලය නමිනි
    (iii) පංච සීලය නමිනි    (iv) ත්‍රිකෝටි පාරිශුද්ධ සීලය නමිනි

05. සුදොවුන් රජතුමා බුදුරදුන්ට කිඹුල්වත් නුවරට වඩින ලෙස ආරාධනාවක් යැව්වේ
    (i) ඡන්න ඇමති මඟිනි    (ii) කාළුදායි ඇමති මඟිනි
    (iii) රාහුල කුමරු මඟිනි    (iv) නන්ද කුමරු මඟිනි

06. ත්‍රිලක්ෂණ වලින් එකක් නොවන්නේ
    (i) අනිත්‍ය ලක්ෂණය    (ii) දුක්ඛ ලක්ෂණය
    (iii) ධම්ම ලක්ෂණය    (iv) අනාත්ම ලක්ෂණය

07. බුදු සසුනේ කීකරුකමින් අගතැන්පත් භික්ෂුව ලෙස පිළිගැනෙනුයේ
    (i) සැරියුත් හිමි    (ii) මුගලන් හිමි
    (iii) රාහුල හිමි    (iv) ආනන්ද හිමි

08. සිදුහත් බෝසතාණෝ දුෂ්කර ක්‍රියා කළ කාලසීමාව වනුයේ
    (i) අවුරුදු හයකි    (ii) අවුරුදු අටකි
    (iii) අවුරුදු පහකි    (iv) අවුරුදු හතකි

09. ලංකාවේ ප්‍රථම ස්ථූපය වන්නේ
    (i) මිරිසවැටියයි    (ii)ථූපාරාමයයි
    (iii) රුවන්වැලි සෑයයි    (iv) කිරි වෙහෙරයි

10. බුද්ධත්වයට පත්ව දෙවන සතියේදී බුදුරජාණන් වහන්සේ ලොවට දුන් ආදර්ශය වන්නේ
    (i) සමානාත්මතාවයයි    (ii) මෛත්‍රීයයි
    (iii) කළගුණ සැළකීමයි    (iv) දෙමාපියන්ට සැළකීමයි

අංක 11 සිට 15 දක්වා ඇති පහත සඳහන් ප්‍රකාශ හරි නම් ( √ ) ලකුණද වැරදි නම් ( X ) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න

11. සිදුහත් කුමරු ඉපදුනේ ලුම්බිණි සල් උයනේදීය. ( )

12. සිදුහත් බෝසතාණෝ බුදු බව ලැබුවේ අජපල් නුගරුක මුලදීය. ( )

13. සත්වයාගේ මරණය සහ උපත පිළිබඳව දැන ගැනීමේ නුවණ නම් බුද්ධ ඥානයයි. ( )

14. "රාහුලයෙක් උපන්නා බැම්මක් ඇති වුණා" යනුවෙන් යශෝධරා දේවිය විසින් ප්‍රකාශ කරන ලදී. ( )

15. රම්‍ය , සුරම්‍ය , සුභ යනු සිදුහත් කුමරු වෙනුවෙන් තැනූ මාලිගා තුනකි. ( )

අංක 16 සිට 20 දක්වා ඇති "A "කොටසෙහි ප්‍රකාශ සඳහා නිවැරදි පිළිතුරු " B "කොටසින් තෝරා යා කරන්න

| "A" | "B" |
|---|---|
| 16 . තෙරුවන් කෙරෙහි පැහැදීම | අනිත්‍ය |
| 17. යම් යම් දේ වලට ආශා කිරීම | චූල්ලකිස්ස හිමි |
| 18. කිසිම දෙයක් ස්ථිර නැත | ශ්‍රද්ධාව |
| 19. ඇත්ත කතා කිරීම | තණ්හාව |
| 20. මහලු වියේදී පැවිදි වූ හිමි නමකි | වාචසික කුසලයයි |

( ලකුණු 2 x 20 = 40 )

ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
මධ්‍ය වාර පරීක්ෂණය - 2014
බුද්ධ ධර්මය – II පත්‍රය
6 ශ්‍රේණිය

කාලය පැය 01 මිනිත්තු 30 යි.

නම / විභාග අංකය :- ..............................................................................................

---

පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01.

i. වෙසක් සතිය තුළ පන්තිය සැරසීමට යොදාගත් ද්‍රව්‍ය දෙකක් ලියන්න ( ලකුණු 02 )
ii. එහිදී ඔබට මතු වූ ප්‍රායෝගික ගැටළු තුනක් නම් කරන්න ( ලකුණු 03 )
iii. මේ සඳහා ඔබට උපදෙස් ලබාදුන් දෙදෙනෙකු නම් කරන්න ( ලකුණු 02 )
iv. වෙසක් සතිය තුළදී පාසල තුළ ඔබ විසින් සිදු කළ පින්කම් දෙකක් ලියන්න ( ලකුණු 02 )
v. සාමූහිකව කටයුතු කිරීමේදී ඔබ ලබාගත් අත්දැකීම් දෙකක් ලියන්න ( ලකුණු 02 )
vi. වෙසක් සතිය තුළ පාසල් පරිසරය අලංකාර කළ ආකාරය පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න ( ලකුණු 03 )
vii. මේ සියළු ක්‍රියාකාරකම් තුළින් ඔබේ සිතට දැනුණු හැඟීම් මොනවාදැයි කෙටියෙන් ලියා දක්වන්න ( ලකුණු 02 )

02.

" ළමයිනේ පන්සල් යන්න මල් ටිකක් කඩන්න." අම්මා කීවාය.
" අක්කේ මං පොලිතීන් බෑග් එකක් අරගෙන එන්නම්."

i. අම්මා මෙසේ කීවේ කාටද? ( ලකුණු 02 )
ii. මල් නෙළීම සඳහා පොලිතීන් බෑගය වෙනුවට ඔවුන් භාවිතා කළේ කුමක්ද?( ලකුණු 01 )
iii. මල් නෙළීමේදී පිළිපැදිය යුතු සිරිත් දෙකක් ලියන්න ( ලකුණු 02 )
iv. විහාරස්ථානයට ගොස් ඔබ වැඳුම් පිදුම් කරන අනුපිළිවෙල නම් කරන්න ( ලකුණු 03 )
v. පාඩමේ සඳහන් පරිදි අම්මා, තාත්තා, දුව පන්සල් යාමට පෙර සූදානම් වූයේ කෙසේද? ( ලකුණු 03 )

03.

i. රාහුල කුමරුගේ දෙමාපියන් කවුරුන්ද? ( ලකුණු 02 )
ii. රාහුල කුමරු උපන් දිනයේදී පියා විසින් කරන ලද්දේ කුමක්ද? ( ලකුණු 02 )
iii. රාහුල කුමරු පැවිදි වන විට වයස අවුරුදු කීයද? ( ලකුණු 02 )
iv. රාහුල හිමියන්ගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න ( ලකුණු 02 )
v. රාහුල හාමුදුරුවන් සඳහා බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කිරීමේදී යොදාගත් උපමා දෙක නම් කරන්න ( ලකුණු 03 )

04.

i. අත්තුපනායික ධර්ම ක්‍රමය යනු කුමක්ද? ( ලකුණු 02 )
ii. ඉහත ධර්ම ක්‍රමය සඳහන් වන ධම්මපද ගාථාව ලියන්න ( ලකුණු 04 )
iii. මෙම ගාථාව සඳහාන් පාඩම ඉගෙන ගැනීමෙන් පසු ඔබට ඇති වූ හැඟීම් පිළිබඳ විස්තරයක් කරන්න ( ලකුණු 05 )

05.

i. නව අරහාදී බුදු ගුණ වලින් තුනක් නම් කරන්න ( ලකුණු 03 )
ii. ඉන් එකකට බුදුගුණාලංකාරයේ ඇති කවිය හෝ අර්ථය දක්වන්න ( ලකුණු 04 )
iii. ඔබ බුද්ධානුස්සති භාවනාව වඩන අයුරු විස්තර කරන්න ( ලකුණු 04 )

06.

i. පොහොය දින වල ඔබ සමාදන් වන සීලය කුමක්ද? ( ලකුණු 03 )

ii. එදිනම ඔබ නොකළ යුතු ක්‍රියා තුනක් ලියන්න ( ලකුණු 03 )

iii. සිල් සමාදන් වන ඔබ ඇතිකරගත් යහපත් ආකල්ප මොනවාද? ( ලකුණු 05 )

07.

ඔබ නිර්මාණය කළ සංඛ්‍යා ධර්ම කෝෂයේ,

i. සංඛ්‍යා තුනක් ඇතුලත් ධර්ම කරුණක් නම් කරන්න ( ලකුණු 03 )

ii. බාහිර පොත පතින් උපුටාගත් සංඛ්‍යා හතරක් ඇතුලත් ධර්ම කරුණු දෙකක් සඳහන් කරන්න ( ලකුණු 04 )

iii. සංඛ්‍යා ධර්ම කෝෂය නිර්මාණය කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න ( ලකුණු 04 )